# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1895/40 - 2015 ජනවාරි මස 02 වැනි සිකුරාදා - 2015.01.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ, අකුරණ ගබඩා ජලාශය හා පොම්පාගාරය ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස් වල නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2014 දෙසැම්බර් මස 29 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.

#### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 559, බුළුගොහොතැන්න, ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, බුළුගොහොතැන්න ගමේ පිහිටි, බලය ලත් මිනින්දෝරු රංජිත් වීරසිංහ මහතා විසින් මැන සකස් කරන ලද අංක 1149/2011 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 6 හා 7 වශයෙන් දැක්වෙන, "පල්ලිය ගාව වත්ත" නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 26.25 ක් පමණ වන ඉඩම් කොටස් දෙක :

**කැබලි අංක : 06**
ඉඩමේ නම : පල්ලිය ගාව වත්ත
මායිම් :

| | | |
|---|---|---|
| *උතුරට* | : | අංක 1149/2011 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 4 හා 5 ; |
| *නැගෙනහිරට* | : | අකුරණ සිට මහ පල්ලිය දක්වා වූ මාර්ගයේ (ප්‍රාදේශීය සභා) සිට නිවාස දක්වා යන පාර ; |
| *දකුණට* | : | අංක 1149/2011 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 7 ; |
| *බටහිරට* | : | අංක 1149/2011 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 4. |

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් :* 1. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,
ග්‍රෙගරි පාර,
කොළඹ 07.

2. එම්. එෆ්. එම්. ෂිහාන් මහතා,
පල්ලියවත්ත,
බුළුගොහොතැන්න.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කැබලි අංක : 07**

ඉඩමේ නම : පල්ලිය ගාව වත්ත

මායිම් :

| | | |
|---|---|---|
| *උතුරට* | : | අංක 1149/2011 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 4 හා 6 ; |
| *නැගෙනහිරට* | : | අකුරණ සිට මහ පල්ලිය දක්වා යන මාර්ගයේ (ප්‍රාදේශීය සභා) සිට නිවාස දක්වා වැටී ඇති පාර ; |
| *දකුණට* | : | රෂින් හා තවත් අය හිමිකම් කියන පල්ලියගාව වත්ත හා මහ පල්ලිය හිමිකම් කියන පල්ලියගාව වත්ත ; |
| *බටහිරට* | : | පල්ලියගාව වත්ත හා අංක 1149/2011 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 2. |

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන්* :

1. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,
ග්‍රෙගරි පාර,
කොළඹ 07.

2. එම්. එෆ්. එම්. මෆාහිරා මහත්මිය,
පල්ලිය ගාව වත්ත,
බුළුගොහොතැන්න.

01 - 512

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.